# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My Ref. | CSS/7/1/9/2018 | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2018.10. 12 |

**ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 11-2018**

දකුණු පළාත් සභාවේ සියළුම
ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්,
ගණන් දීමේ නිලධාරීන්,
ප්‍රධාන ගණකාධිකාරී වරුන්
හා ගණකාධිකාරීවරුන් වෙත.

## <u>රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය - 2016</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 (III) හා 2018.06.14 දිනැති ලිපිය හා බැඳේ. (එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමග අමුණා ඇත.)

**02.**එම චක්‍රලේඛය දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීමට ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/1/6/3/8 හා 2018.10.04 දිනැති ලිපිය මගින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

**03.**එමගින් උක්ත කරුණට අදාළව නිකුත් කරන ලද 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි 06 ඡේදය වෙත ඔබගේ අවධානය යොමුකර ඇත.

**04.**එකී ඡේදයේ 6.1 උප ඡේදය පහත පරිදි සංශෝධනය කිරීම සඳහා 2018.05.30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

"**06.** වැටුපෙහි ප්‍රතිශතයක් වශයෙන් ගෙවනු ලබන දීමනා

**6.1** කිසියම් ආයතනයක හෝ සේවාවක/තනතුරක හෝ නිලධරයන් සඳහා වැටුපෙහි ප්‍රතිශතයක් වශයෙන් හෝ/ සහ වැටුප මත ගණනය කර ගෙවනු ලබන සියලුම දීමනා 2018.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වර්තමාන වැටුපෙහි මූල්‍යමය අගය පදනම් කර ගනිමින් ගණනය කළ යුතුය."


| | | | | |
|---|---|---|---|---|
| ප්‍රධාන ලේකම්<br>பிரதான செயலாளர்<br>Chief Secretary 091 2232343 | කාර්යාලය<br>காரியாலயம்<br>Office 091 2234052 / 091 2226118 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax 091 2246299 | විද්‍යුත් තැපෑල<br>மின் அஞ்சல்<br>E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය<br>இ தளம்<br>Web site www.cs.sp.gov.lk |

05. මෙම චක්‍රලේඛ උපදෙස් අනුව ගෙවීම් කටයුතු කරන ලෙස දැනුම් දෙන අතර, මේ පිළිබඳව ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව යටතේ පවතින සියලු ආයතන දැනුවත් කරන ලෙසද කාරුණිකව දන්වමි.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත්:-

01.සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස.
02.නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන / මුදල් / පිරිස් හා පුහුණු) : අ.ක.ස.
03.අධ්‍යක්ෂ( අයවැය / ගිණුම් හා ගෙවීම් ) : අ.ක.ස.
04.අධ්‍යක්ෂ, දකුණු පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව : දැ.ගැ.ස

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 03/2016 (III)

මගේ අංකය : EST 5/4/24(XIX)-6
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2018.06.14

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## <u>රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය - 2016</u>

ඉහත කරුණට අදාළව නිකුත් කරන ලද 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි 06 ඡේදය වෙත ඔබගේ අවධානය යොමු කරවමි.

02. එකී ඡේදයේ 6.1 උප ඡේදය පහත පරිදි සංශෝධනය කිරීම සඳහා 2018.05.30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

**"06. වැටුපෙහි ප්‍රතිශතයක් වශයෙන් ගෙවනු ලබන දීමනා**

**6.1 කිසියම් ආයතනයක හෝ සේවාවක/ තනතුරක හෝ නිලධරයන් සඳහා වැටුපෙහි ප්‍රතිශතයක් වශයෙන් හෝ/ සහ වැටුප මත ගණනය කර ගෙවනු ලබන සියලුම දීමනා 2018.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වර්තමාන වැටුපෙහි මූලාමය අගය පදනම් කර ගනිමින් ගණනය කළ යුතු ය."**

03. මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

පද්මසිරි ජයමාන්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය